සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	පෙරදිග සංගීතය I	කාලය நேரம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

■ අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන රාග යුගලයකි.
   I. කාෆි - යමන් ii. යමන් - භෛරවි iii. කාෆි - බිලාවල් iv. යමන් - භූපාලි

2. සර්ව කෝමල රාගයකි,
   I. කාෆි ii. යමන් iii. භෛරවි iv. භූපාලි

3. ග - ධ සහ ධ - ග වාදී, සංවාදී ස්වර වන රාග යුගලය පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
   I. භූපාලි - භෛරවි ii. භූපාලි - බිලාවල් iii. යමන් - භෛරවි iv. කාෆි - භූපාලි

4. ශුද්ධ නිශාදය විවාදි ස්වරයක් ලෙස යෙදෙන නිර්දේශිත රාගයකි,
   I. භූපාලි ii. යමන් iii. කාෆි iv. බිලාවල්

5. "මේල'' පිළිබඳව නොගැළපෙන පිළිතුර තෝරන්න.
   i. ගායනයට හා වාදනයට සුදුසු වීම.
   ii. ආරෝහණ ස්වර පමණක් ඇතුළත්ව තිබීම.
   iii. මේලයකින් රාග බිහිකිරීම'
   iv. හින්දුස්ථානි සංගීතයේ ඨාඨ යනුවෙන් හැඳින්වීම.

6. රාගයක් ගායනය වාදනය කිරීමේදී එහි අලංකාරය පිණිස ප්‍රකෘති විකෘති ස්වර සියල්ලම භාවිතා කළ හැකි රාගයකි,
   I. භූපාලි ii. බිලාවල් iii. භෛරවි iv. කාෆි

\

7. රාගයකින් කිසිදු විටක ඉවත් කළ නොහැකි ස්වරය වන්නේ,
   i. සජ්ජය යි. ii. මධ්‍යමය යි. iii. පංචමය යි. iv. රිෂභය යි.

8. ලක්ෂණ ගීතයක දැකිය නොහැකි අංගයකි,
   i. රාග විස්තර ඇතුළත් වී තිබීම. ii. රාග අංග ඇතුළත වී තිබීම.
   iii. ස්වර රචනාවක් හා පද රචනාවක් තිබීම. iv. ස්වර රචනාවක් පමණක් වීම.

9. රාගයක් වීම සඳහා අවම වශයෙන් ස්වර ..... ක් තිබිය යුතු වේ.
   i. 4 ii. 5 iii. 6 iv. 7

Past Papers Wiki

■ අංක 10 සිට 13 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව උපයෝගී කර ගන්න.

A	B	C	D
ගෙ ක කත්	ත තිං ති	ධ ධිං ධි	න තු තිට

10. දීප් චන්දි තාලය වැයීම සඳහා අවශ්‍ය අවනද්ධ අක්ෂර ඇතුළත් වන්නේ,
i. A හා B හිය. ii. B හා C හි ය. iii B හා D හිය. iv. C හා D හිය.

11. තබලාවේ දෑතම භාවිතා කරමින් වැයිය හැකි අක්ෂර අඩංගු වරණය තෝරන්න.
i. A ii. B iii. C iv. 4

12. දයාවේ සහාභි කොටස පමණක් උපයෝගී කර ගනිමින් වැයිය හැකි අක්ෂර යුගලයකි.
i. න, ත ii. තිං, න iii. ති, තිට iv. ත, න

13. ඉහත වගුවේ A, B, C, D කොටස් හතරේම අක්ෂර භාවිතා කරමින් වැයිය හැකි තාල පදය වන්නේ
i. දාදරා ii. කෙහෙර්වා iii. ජජ් iv. ත්‍රිනාලය

■ **පහතින් දක්වා ඇත්තේ ගීත ප්‍රස්ථාරයකි. එම ප්‍රස්තාරය ආශ්‍රයෙන් අංක 14 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
රූ s රෑ / සේ s අදි / නා s ලෙ /සේ s අත් / ලෙ ල දි / දී s විදු / ලි ය ප / බා s s s

14. මෙම ගී පාදයේ ගී මත් ගණන අනුව භාවිත කළ හැකි නාමය වන්නේ,
I දොළොස්මත් පැදි ii. සොළොස්මත් පැදි iii සුවිසිමත් පැදි iv. අට විසිමත් පැදි

15. මෙම ගී පාදයේ පූර්ණ යතියට හිමි මාත්‍රා ගණන,
i. හයකි. ii. හතරකි. iii. අටකි. iv. නවයකි.

16. මෙම ගී පාදයේ සැදැස්මත් ගණන,
i. විසි හයකි. ii. දහසයකි. iii. දොළසකි. iv. හයකි.

17. මෙම ගී පාදය ආරම්භ වන්නේ,
i. සමග්‍රහයෙනි. ii. අවග්‍රහයෙනි. iii. විශමග්‍රහයෙනි. iv. අනුතාලයෙනි

18. මෙම ගී පාදය ගායනා කල හැකි තිත් රූපය
i. සුළු තනි තිත ii. මැදුම් මහ දෙතිත iii. මහ තනි තිත iv. සුළු මැදුම් දෙතිත

19. මෙම ගී පාදය අයත් වන කාව්‍ය සංග්‍රහය වන්නේ,
i. සැළළිහිණි සංදේශය ii. ගුත්තිලය iii. ප්‍රශස්ති කාව්‍ය iv. සුභාෂිතය

20. දේශීය අවනද්ධ භාණ්ඩයක් වන යක් බෙරය හඳුන්වන නම් රාශියක් ඇත. ඒ අතරින් යක් බෙරය අදාළ නොවන නාමය කුමක්ද?
i. බොකු බෙරය ii. දෙවොල් බෙරය iii. දික් බෙරය iv. මගුල් බෙරය

Past Papers Wiki

■ අංක 21 සිට 23 දක්වා ප්‍රශ්න සඳහා පහත ගී නඳ ඇසුරු කර ගන්න.

අ. නන් සිරින් වොරැදි

ඇ. බැස සීතල ගගුලේ

ඉ. මහ බෝධි මුලේ

උ. දැක්කොත් පද්මාවතී

21. ඉහත සඳහන් ගී පද පිළිවෙළින් නම් කළ හැකි වන්නේ,

i. නව නාට්‍ය, ගුවන් විදුලි සරල ගී, ග්‍රැමෆෝන් ගී, නූර්ති

ii නූර්ති, ගුවන් විදුලි සරල ගී, ග්‍රැමෆෝන් ගී, නව නාට්‍ය

iii නූර්ති, ග්‍රැමෆෝන් ගී, ගුවන් විදුලි සරල ගී, නව නාට්‍ය ගී

iv නව නාට්‍ය ගී, ගුවන් විදුලි සරල ගී, ග්‍රැමෆෝන් ගී, නූර්ති ගී

22. ඉහත ගී පාඳ අතුරෙන් අනුකාරක ගීතයකි,

i අ ii ඇ iii ඉ iv උ

23. ඉහත ගී පාඳ අතුරෙන් ආනන්ද සමරකෝන් මහතා හා සම්බන්ධ වන ගී පාඳය තෝරන්න.

i අ ii ඇ iii ඉ iv උ

24. පහත සඳහන් ගී අතුරෙන් ග්‍රැමෆෝන් ගී ගණයට නොවැටෙන ගීතය කුමක් ද?

i. සිළුමිණි සෑය වඳිමි ii. දැඩිකළ මාතා

iii ඕළු පිපිලා විල ලෙල දෙනවා iv. අඩු කලේ සෙලවීම නිසා

25. ග්‍රැමෆෝන් ගීත වල මුල් යුගයේ ගායක ගායිකාවන් අතරට අයත් නොවන්නේ කවුද?

i. එච්. ඩබ්. රූපසිංහ ii. ඇනී බොතේජු iii. ලක්ෂ්මි බායි iv. ටී. එම්. ජයරත්න

26. ලංකාවේ නිර්මාණය වූ ප්‍රථම සංඩිවනිය වූ 'ගොයම් දා මඟුල' නිර්මාණය කළ සංගීතඥයා,

i. ඩබ්.බී. මකුලොළුව මහතා ය. ii. ආනන්ද සමරකෝන් මහතා ය.

iii. රෝහණ බැද්දගේ මහතා ය. iv. ලයනල් රන්වල මහතා ය.

27. ලාංකීය සංගීත ක්ෂේත්‍රයට විශාල මෙහෙයක් කළ සී ද එස් කුලතිලක විසින් රචනා කළ ග්‍රන්ථයකි,

i. හෙළ ගී මග ii. නොගිය ගමන iii. ගුවන් තොටිල්ල iv. ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය

28. පාරම්පරික නර්තන ශිල්පියෙකු වූ මෙතුමා දයානන්ද ගුණවර්ධනයන්ගේ වේදිකා නාට්‍ය කිහිපයකටම සංගීතය සපයා ඇත. එම සංගීත වේදියා සහ ඔහු විසින් සංගීතය සැපයූ නාට්‍යයන් පිළිවෙළින්,

i. රෝහණ බැද්දගේ - නොගිය ගමන ii. ලයනල් රන්වල - එක ගෙඩියයි පල ගත්තේ

iii. රෝහණ බැද්දගේ - මධුර ජවනිකා iv. ලයනල් රන්වල - ආනන්ද ජවනිකා

29. ප්‍රධාන තත් හතකින් යුත් මිශ්‍රාබ් උපකරණයෙන් නාදය උපදවන භාණ්ඩය වාදනය කිරීමේ සුප්‍රසිද්ධ වාද්‍ය ශිල්පියා වන්නේ,

i. ශකීර් හුසේන් ii. රවි ශංකර් iii. හරි ප්‍රසාද් චෞරසිංහ iv. ජායි කිෂන්

30. මපධ - | ප - ග - | % මෙම ස්වර කණ්ඩය ඉදිරියේ ඇති Repitation mark යෙදී ඇති ආකාරය අනුව වාදනය විය යුතු ස්වර පාඨය වන්නේ,

i. මපධ - | ප - ග - | ප - ග - | ප - - - ii. මපධ - | මපධ - | ප - ග - | ප - ග -

iii. මපධ - | ප - - - | ප - ග - | ප - - - iv. මපධ - | ප - ග - | මපධ - | ප - ග -

PAST PAPERS WIKI

- අංක 31 සිට 34 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් වගුව ඇසුරු කර ගන්න.

A	B	C
සබේ විදානේ	සූත්‍රධාරි	පොතේ ගුරු

31. ඉහතින් සඳහන් වන්නේ රංග සම්ප්‍රදායන් තුනකට අයත් චරිත තුනකි. එම රංග සම්ප්‍රදායන් පිළිවෙළින් නම් කළ හැකි වන්නේ,
    i. A - කෝළම් B - නූර්ති C- නාඩගම්
    ii. A - නූර්ති B - නාඩගම් C- කෝළම්
    iii. A - නාඩගම් B - නූර්ති C- කෝළම්
    iv. A - නූර්ති B - කෝළම් C- නාඩගම්

32. A කොටසට අදාළ රංග සම්ප්‍රදාය සඳහා භාවිතා කළ හැකි භාණ්ඩ යුගලයකි.
    i. සර්පිනාව - තබ්ලාව
    ii. හොරණෑව - යක් බෙරය
    iii. සර්පිනාව - මද්දලය
    iv. හොරණෑව - මද්දලය

33. B කොටස සඳහා සුදුසු වූ නාට්‍යයකි.
    i. ඉයුජින් ii. පද්මාවතී iii. ශ්‍රී වික්‍රම iv. වෙස්සන්තර

34. කර්ණාටක සංගීතයේ ආභාසය ලද රංග සම්ප්‍රදාය වන්නේ,
    i. A ii. B iii. C iv. B සහ C

35. "තෙරේ මේරේ මිලනි කී යේරනා" ගීතය සඳහා වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.
    i. අභිමාන් චිත්‍රපටය - ඛමාජ් රාගය
    ii. බව්ජි බවුරා චිත්‍රපටය - භෛරවි රාගය
    iii. අභිමාන් චිත්‍රපටය - භෛරවි රාගය
    iv. බව්ජි බවුරා චිත්‍රපටය - ඛමාජ් රාගය

36. "F G A B́ C D E F" මෙම ස්වර අයත් වන ස්කේලය (Scale)
    i. F Minor Scale
    ii. G Minor Scale
    iii. F Major Scale
    iv. C Major Scale

37. බටහිර සමාඝාත (Percussion) භාණ්ඩ අතුරෙන් Diffinite භාණ්ඩයක් නොවන්නේ මින් කවරෙක් ද?
    i. Bass Drum ii. Side Drum iii. Congo Drum iv. Gloclconspeel

38. සංගීත ප්‍රසංගයකදී භාවිතා කරන තාක්ෂණික උපකරණ අතරින් ශබ්දය අඩු වැඩි කිරීම සඳහා උපයෝගී කරගනු ලබන්නේ,
    i. මික්සරය (Mixer)
    ii. ඇම්ප්ලිෆයර් (Amplifier)
    iii. ස්පීකර් (Speaker)
    iv. මයික්‍රෆෝනය (Microphone)

39. අන්තර් ජාලයේ ප්‍රචලිත විද්‍යුත් විශ්ව කෝෂයක් ලෙස දක්වන වෙබ් අඩවියකි.
    i. E Music ii. E - Learning iii. Sound Fonts iv. Wikipedia

40. යතුරු පුවරු සංගීත භාණ්ඩ මඟින් කරනු ලබන නිර්මාණයන් හඳුන්වනු ලබන නාමය වන්නේ,
    I. MIDI ii. E Music iii. Adobe Audition iv. Sound Forge

PAST PAPERS WIKI
www.PastPapers.wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10	පෙරදිග සංගීතය - II	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

II කොටස

■ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01. i. නිර්දේශිත ඖඩව ජාති රාගයේ මේල ස්වර ලියා දක්වන්න.

ii බිලාවල් රාගයේ අනුවාදී ස්වර මොනවාද?

iii "දිත්තං තං ගතිත ගතං" යනුවෙන් වැයීමට සුදුසු වන්නේ කුමන අවනද්ධ භාණ්ඩය ද?

iv. "මෑ වේ මා දුටු කොමල ලියා" ගීතය .....නාට්‍යයටද "සත් සියක් කපු මල්" ගීතය ..... නාට්‍යයට ද අයත් වේ.

v. මාත්‍රා 2/3 තාලය ..... තාලය ලෙස හැඳින්වෙන අතර ඊට සමාන වූ තිත ..... වේ.

vi. නුර්ති ගීත වල සුවිශේෂී අංගයක් ලෙස ..... තිබූ අතර නාඩගම් ගී වල ..... නමින් විශේෂිත කොටසක් විය.

vii බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් Single Reed වාද්‍ය භාණ්ඩයක් හා Double Reed වාද්‍ය භාණ්ඩයක් බැගින් නම් කරන්න.

viii උපදේශාත්මක ගීතයක් සඳහා උදාහරණ ගී පාදයක් ලියා දක්වන්න. (ල. 12)

02. A). නි රි ග, රි , නි ධ නි රි ස

B). ග රි ග ප , ම ග ම රි ස

C). ග රි ස ධ , ස රි ග , ග ප ධ ප ග

i. ඉහත ස්වර සංගතිවලින් දැක්වෙන රාග හඳුනාගෙන නම් කරන්න. (ල. 3)

ii. ඉහත රාග අතුරින් ශුද්ධ ස්වර හත යෙදෙන රාගය නම් කර, එහි මේලය, වාදී, සංවාදී, ගානසමය සඳහන් කරන්න. (ල. 4)

iii A සහ C රාග දෙකෙහි සමානතා තුනක් ලියන්න. (ල. 3)

03. A - ම ග රි | ස රි නි | ස - ධ | නි ස - |

B - ස ස රි රි | ග ග ම ම | ප - - - ම | ප ධ නි ස් |

i. ඉහත සර්ගම් පාදයන් අයත් රාග සහ තාල නම් කරන්න. (ල. 2)

ii. A අක්ෂරයට අදාළ සර්ගම් ගීතයේ අන්තරා කොටස ප්‍රස්තාර කර දක්වන්න. (තාල සංකේත යොදා) (ල. 3)

iii. A සහ B අක්ෂරවලට අදාළ තාල දෙකෙහි අසමානතා තුනක් ලියා දක්වන්න. (ල. 2)

iv. B ස්වර පාදය ගායනයේදී වාදනයට සුදුසු හින්දුස්ථානී තාලය ප්‍රස්තාර කරන්න. (ල. 2+3=5)

PAST PAPERS WIKI

Past Papers Wiki

04. පහත ගී පාද ඇසුරින් පිළිතුරු සපයන්න.

- × මනමත් කරවන දන මුළු දෙරණා
- × දඩිබිඩි ගගා කරනා වැඩ
- × දොඩම් කපාලා ඇඹුල් තනාලා
- × පැහැසරණිය මිනි පැමිණිය
- × රූ රැසේ අඳිනා ලෙසේ අත්
- × වෙල් යායක ගොන් දෙන්නෙක්

i. ඉහත ගී පාදයන් ගැමි ගී හා සේ ගී ලෙස වර්ගකර දක්වන්න. (ල. 4)

ii ගැමි ගී හා සේ ගී පිළිබඳ කරුණු හතරක් සංසන්දනාත්මකව ලියා දක්වන්න. (ල. 4)

iii ඉහත ගී පාද අතුරින් සොළොස්මත් පැදියක පළමු පාදය ප්‍රස්තාර කරන්න. (ල. 4)

05.

	ගී වර්ගය	ගීතය	ගායනය/නිර්මාණය
A	සරල ගී	ශ්‍රී රාහුල හිමිගේ නාමේ	ඩබ්.ඩී. අමරදේව
B	කණ්ඩායම් ගී	යස ඉසුරු පිරුණු	ත්‍රී සිස්ටර්
C	ග්‍රැමෆෝන් ගී	සසර වසන තුරු	ලූෂන් බුලත්සිංහල
D	නව නාට්‍ය ගී	වන දෙව්ලිය තුරුලේ	එච්.ඩබ්. රූපසිංහ


i. ඉහත වගුවේ A, B, C, D අක්ෂර වලට ගැළපෙන පරිදි ගීතය හා ගායනය / නිර්මාණය නැවත සකස් කර ලියන්න. (ල. 4)

ii කණ්ඩායම් ගීත පිළිබඳව ඔබ උගත් වෙනත් කරුණු දෙකක් ලියා දක්වන්න. (ල. 2)

iii ග්‍රැමෆෝන් ගීත ගායනා කරනු ලැබූ තවත් ගායන ශිල්පීන් / ශිල්පිනියන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

iv. සරල ගීතයක අඩංගු අංග හතරක් සඳහන් කර ඉන් දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ල. 4)

06. පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. මෙම ප්‍රස්තාරයේ අංක 1 සිට 8 දක්වා සංකේත නම් කරන්න. (ල. 4)

ii අංක 1, 2, 3, 8 සංකේත වලින් දැක්වෙන අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

iii ඉහත බටහිර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. (ල. 4)

07. පහත දැක්වෙන මාතෘකා අතරින් තුනක් තෝරාගෙන විශේෂ කරුණු හතරක් ඇතුළත් වන සේ කෙටියෙන් විස්තර කරන්න.

i. ග්‍රැමෆෝන් යුගයේ ස්වාධීන තනු යුගය සඳහා ආනන්ද සමරකෝන් ගුරුන්ගේ දායකත්වය

ii හරි ප්‍රසාද් චෞරසියා, ශකීර් හුසේන්, ජග් ජිං සිං යන ඉන්දීය සංගීත ශිල්පීන් අතරින් එක් අයෙකුගේ ජීවන තොරතුරු හා ගායන/ වාදන කෞෂල්‍ය පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

iii. ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න.

v. කපිරිඤ්ඤා සංගීතයේ සුවිශේෂී ලක්ෂණ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 12)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library